**සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය - 2015**
-------------------------------------------------------------

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කර්මාන්තායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 සමාගම පිහිටුවීම හා හිමිකාරීත්වය
----------------------------------------

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා නැවත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේද ලියාපදිංචි කර ඇත. මෙය රජයේ පූර්ණ හිමිකාරීත්වය සහිත රාජ්‍ය සමාගමකි.

1.5 අහිතකර මතය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංග වලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

--------------

2.1 අහිතකර මතය

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

--------------------------------

දිනකට උක්ගස් මෙට්‍රික් ටොන් 1,200 ක් බැගින් ඇඹරුම් වාරයේ දින 160 ක් තුල උක්ගස් මෙට්‍රික් ටොන් 192,000 ක් ඇඹරීමෙන් සීනි මෙට්‍රික් ටොන් 16,320 ක් සහ ස්කාගාරය මඟින් දිනකට මොලැසස් මෙට්‍රික් ටොන් 30 ක් හා වාර්ෂිකව මෙට්‍රික් ටොන් 9,000 ක් ( දින 300 ක් තුල) නිෂ්පාදනයට යොමු කිරීමෙන් පරිපාරක ස්ප්‍රීතු ලීටර මිලියන 3.9 ක ප්‍රමාණයක් දල ජාතික නිෂ්පාදිතය වෙනුවෙන් දායක කිරීමට හැකියාවක් පැවති කන්තලේ සීනි කර්මාන්තායතනය 1993 සැප්තැම්බර් 01 දින සිට තාවකාලිකව රජයට පවරා ගන්නා ලද අතර සේවකයින් 1,139 කට වන්දි ප්‍රදානය කරන ලදී. එසේ වුවද එම කර්මාන්තයතනය 1994 මාර්තු 31 දින සිට කිසිදු නිෂ්පාදන කටයුත්තක් නොමැතිව වසා දමා තිබුණි.

මේ හේතුවෙන් කර්මාන්තායතනය සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇති අතර දැනට සිටින සේවකයන් 39 දෙනෙකු සඳහා වාර්ෂිකව භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මඟින් වැටුප් ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව ආයතනයේ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතී.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතියේ 10 ඡේදය ප්‍රකාරව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක තිබිය යුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණ අතර ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා ගිණුම්කරණ සටහන් නිසි පරිදි සකස් කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ ගිණුම්කරණ පදනම් හා මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට අදාලවන භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතියේ 09 ඡේදය ප්‍රකාරව තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගය මත මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමකින් තොරව රු. 47,440,818 ක් වූ තොගය පොත් අගය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) තොග වටිනාකම තුල 2010 වර්ෂයටත් පෙර සිට පැවති රු. 17,410 ක් වටිනා පැරණි ගොවිපල ආහාර තොගයක් ඇතුලත්ව තිබූ අතර මෙම තොගය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ තොග ලියා හැරීමක් ප්‍රවර්තන වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

--------------------------------------

ප්‍රමිතියේ 07 ඡේදය ප්‍රකාරව මුදල් සහ මුදල් හා සමාන ශේෂ ලෙස නොගැනෙන රු.7,837 ක් මුදල් සහ මුදල් හා සමාන ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 48,323,446 ක ස්ථාවර වත්කම් ඒවා භාවිතයට සුදුසු තත්ත්වයට පත් වූ දිනයන් නොසලකා සම්පූර්ණ වටිනාකම පදනම් කරගෙන ක්ෂය කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව රු. 42,501,105 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අසීමිත ජීවිත කාලයක් සහිත ඉඩම් ක්ෂය කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා කරන තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස සලකා ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තයට හෝ ඌනතාවයට (ආදායම් ප්‍රකාශයෙහි) ඇතුලත් කරමින් හඳුනාගත යුතු වුවද ආයතනයේ පෙර වර්ෂයන් 4කට අදාලව ගණනය කරන ලද ස්ථාවර වත්කම් වලට අදාල ක්ෂය වටිනාකම වූ රු. 5,640,303 ක් පෙර වර්ෂයන්හි සමුච්චිත ලාභය මත ගලපා ගිණුම්ගත කර තිබුණි.

(iv) ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කම්වලට අදාලව කළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(v) 2009 දෙසැම්බර් 31 දිනට පෙර සිට පැවත එන රු. 840,774 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම 2015 දෙසැම්බර් 31 දින වන විටත් දේපල පිරියත උපකරණ වටිනාකම තුල අන්තර්ගතව පැවතුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------

තොග හා උපචිත වියදම් යන ගිණුම් ශේෂ දෙකෙහි මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම හා උපලේඛන අතර එකතුව රු. 1,335,596 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------

පහත සඳහන් එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 127,570,740 | තහවුරු කිරීමේ ලේඛන සහ ශේෂ සනාථන ලිපි |
| ලැබිය යුතු සහ කලින් ගෙවීම් ශේෂයන් | 42,192,409 | තහවුරු කිරීමේ ලේඛන සහ ශේෂ සනාථන ලිපි |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුද්ගලික ආයෝජකයෙකුගෙන් අයවිය යුතු රු. 14,036,376 ක මුදල් ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති අතර එය 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ආ) 2012 සැප්තැම්බර් 09 දින සිට 2014 අප්‍රේල් 30 දක්වා වූ දින 607 ක් සඳහා උක් බඳින දම්වැල් 700 ක් ලංකා සීනි පුද්ගලික සමාගම වෙත කුලියට දීමෙන් අයකර ගතයුතු වූ රු. 4,249,000 ක කුලී මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතනය විසින් 1988 වර්ෂයේ සිට 2010 මැයි මාසය දක්වා කාලය තුල භාවිතා කළ විදුලිය වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 31,513,160 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

2.4. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 156 (5) (6) | ගිණුම්වල හෝ ඒ හා සම්බන්ධ මොනයම් ලියවිල්ලක හෝ මකා දැමීම දිස් නොවිය යුතු අතර ගිණුම් පිළිබඳව සියලුම ලිපි ලේඛන, පොත් පත්, වාර්තා සටහන්, ලේඛන යනාදිය විධි වූ පරිදි බැහැර කරනු ලබන තෙක් නිසි පිළිවෙලට හා මනා තත්ත්වයෙන් සුරක්ෂිත භාරයේ තබා ගත යුතුය. එසේ වුවද ආයතනයේ මුදල් පොත හා අනෙකුත් ලෙජර් ගිණුම් එසේ පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති තොගය හා රු. 48,323,446 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා වර්ෂය අවසානයේ භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 151,583 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 13,020,428 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,172,011 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. පරිපාලන වියදම් රු.4,647,838 කින් වැඩි වුවද භාණ්ඩාගාර ප්‍රදාන රු. 17,117,091 ක් ලැබීම, මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉහත වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ මුළු ආදායම වූ රු. මිලියන 18 න් රු. මිලියන 17.1 ක් එනම් සියයට 91 ක් භාණ්ඩාගාර ප්‍රදානවලින් සමන්විත වී තිබුණි.

(ආ) ආයතනයේ මුළු මෙහෙයුම් වියදම වූ රු. මිලියන 18.6 න් රු. මිලියන 15 ක් එනම් සියයට 81 ක් සේවක වැටුප්, වේතන හා දීමනා යනාදියෙන් සමන්විත විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

2013 අගෝස්තු 21 දිනැති අංක 13/1224/560/005 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා ඒ සම්බන්ධ සංදේශ හා කමිටු වාර්තා ප්‍රකාරව අක්‍රීය ව්‍යවසායක් ලෙස පවතින සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය සතු වත්කම් වගකීම් නිරවුල් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 8,596 ක් වන අතර මෙයින් සියයට 56 ක් එනම් හෙක්ටයාර් 4,800 ක් පමණ උක් වගාව සඳහා සංවර්ධනය කර ඇති අතර සියයට 31 ක් එනම් හෙක්ටයාර් 2,650 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සීනි කම්හල සහ ස්කාගාරයට අයත් සුන්බුන් අගය රු. 25,493,500 ක් වූ සැහැල්ලු හා බර වාහන සහ යන්ත්‍ර සූත්‍ර 213 ක් දැනට අවුරුදු 21 කට ආසන්න කාලයක් පාවිච්චියට ගත නොහැකිව කර්මාන්තායතනය තුල දිරාපත් වෙමින් පැවතුණි.

5. පද්ධති හා පාලනයන්
---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සාමාන්‍යාධිකාරීවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | පිළිගත් ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | | තොග සමීක්ෂණයක් සිදුකර යල්පැන ගිය තොග ඉවත් කිරීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | (i) | ණයගැති සහ ණයහිමි කාල විශ්ලේෂණයන් සකස්කර නොතිබීම. |
| | | (ii) | දීර්ඝ කාලයක් තිස්සේ උපචිත වියදම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | | මානව සම්පත ප්‍රශස්ත හා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබීම. |